# ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# ஊவா மாகாண கல்வித் திணைக்களம்
# Uva Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - 01 වන ඒකක පරීක්ෂණය 2025

General Certificate of Education (Advanced Level) Examination – 01st Unit Test 2025

| 12 ශ්‍රේණිය | 02 | S | I, II | රසායන විද්‍යාව - I, II<br>CHEMISTRY - I, II | කාලය : පැය 01 යි මි. 40<br>Time : One hour & 40 minutes |
|---|---|---|---|---|---|


උපදෙස් :
- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

- පහත දැක්වෙන ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

01. ඉහළම තාපාංකය තිබේ යැයි ඔබ බලාපොරොත්තු වන්නේ පහත කුමන රසායනික ප්‍රභේදයකට ද?
(1) He (2) Ne (3) $CH_4$ (4) $SiH_4$ (5) Ar

02. පරමාණුක ක්වොන්ටම් අංක n = 3, $m_\ell$ = -1 සඳහා තිබිය හැකි කාක්ෂික සංඛ්‍යාව,
(1) 2 (2) 3 (3) 4 (4) 5 (5) 6

03. අවුෆ්බාවු මූලධර්මය හා හුන්ඩ් ගේ නීතිය යන දෙකම උල්ලංඝනය වන කාක්ෂික සටහන වනුයේ,

(1) (↑↓) (↑↓) (↑) ( ) (2) (↑) (↑↓) (↑) ( ) (3) (↑↓) (↑) (↑) (↑)

(4) (↑↓) (↑↓) (↑) (↑) (5) (↑) (↑↓) (↑) (↑)

04. $IO_3^+$, $IO_3^-$, $F_3ClO_2$ හා $F_4BrO^-$ යන ඒවායේ හැඩයන් පිළිවෙළින්,
(1) තලීය ත්‍රිකෝණාකාර, චතුස්තලීය, ත්‍රිආනති ද්විපිරමිඩාකාර සහ සමචතුරස්‍රාකාර පිරමිඩාකාර
(2) තලීය ත්‍රිකෝණාකාර, චතුස්තලීය, T හැඩය, සීසෝ හැඩය
(3) ත්‍රිආනති පිරමිඩාකාර, සීසෝ හැඩය, T හැඩය, අෂ්ඨතලීය
(4) චතුස්තලීය, සමචතුරස්‍රතලීය, ත්‍රිආනති ද්විපිරමිඩාකාර, සමචතුරස්‍රාකාර පිරමිඩාකාර
(5) T හැඩය, සීසෝ හැඩය, , ත්‍රිආනති ද්විපිරමිඩාකාර, අෂ්ඨතලීය

05. වැරදි වගන්තිය තෝරන්න.
(1) $NCl_3$, $SO_3$ හා $PCl_5$ අතුරෙන් එකම ධ්‍රැවීය ප්‍රභේදය $NCl_3$වේ.
(2) Mg, Al, Si හා P මූලද්‍රව්‍ය අතුරෙන් අඩුම පළමු අයනීකරණ ශක්තිය ඇත්තේ Al වලට වේ.
(3) $NO_3^-$, $SO_2$ , $SO_3^{-2}$ හා $ClF_3$ ප්‍රභේද අතුරෙන් එකම හැඩය ඇත්තේ $SO_2$ හා $SO_3^{-2}$ ට පමණි.
(4) B, C, O හා N අතුරෙන් ඉලෙක්ට්‍රෝන ලබා ගැනීමේ ශක්තිය ධන අගයක් ගන්නේ N පමණි.
(5) $S^{-2}$, $N^{-3}$, $P^{-3}$, $O^{-2}$ අතුරෙන් වැඩිම අයනික අරය ඇත්තේ $P^{-3}$ ට වේ.

06. තරංග ආයාමය 220 nm වන ෆෝටෝන මවුලයක ශක්තිය වනුයේ, (ප්ලාන්ක්ගේ නියතය h = 6.626 x $10^{-34}$ JS, ආලෝකයේ ප්‍රවේගය 3 x $10^8$ $ms^{-1}$)'
(1) 542 J (2) 54.2 KJ (3) 544 J (4) 54.4 J (5) 544 KJ

07. *x* හා *y* අංශු දෙකක ඩිබ්‍රොග්ලි තරංග ආයාමය පිළිවෙළින් 1 nm හා 3 nm වේ. *x* හි ස්කන්ධය *y* හි ස්කන්ධය මෙන් තුන්ගුණයකි. *x* හා *y* හි ප්‍රවේග අතර අනුපාතය වන්නේ,
(1) 1 : 1 (2) 1 : 2 (3) 1 : 3 (4) 3 : 1 (5) 2 : 1



Scanned with CamScanner

08. මධ්‍ය පරමාණුවේ මුහුම්කරණය සැලකූ විට, වෙනස් වූ මුහුම්කරණයක් සහිත ප්‍රභේදය වනුයේ,

(1) $H_3O^+$ (2) $^-CH_3$ (3) HCHO (4) $H_2S$ (5) $CH_4$

09. $^{88}_{38}Sr^{+2}$ සම්බන්ධයෙන් නිවැරදි නොවන්නේ,

(1) එහි ප්‍රෝටෝන ගණන 38 කි.
(2) එහි ඉලෙක්ට්‍රෝන ගණන 40 කි.
(3) එහි නියුට්‍රෝන ගණන 50 කි.
(4) එහි ඉලෙක්ට්‍රෝන හා ප්‍රෝටෝනවල එකතුව 76 කි.
(5) එහි නියුට්‍රෝන හා ප්‍රෝටෝනවල එකතුව 88 කි.

10. Mg හි සංයුජතා ඉලෙක්ට්‍රෝනයකට දැනෙන සඵල න්‍යෂ්ටික ආරෝපණය (Z = 12, A = 24)

(1) +12 වේ. (2) + 10 වේ. (3) +12 ට වඩා අඩු වේ.
(4) +12 ට වඩා වැඩි වේ. (5) + 24 වේ.

• අංක 11 සිට 15 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති (a), (b), (c) සහ (d) යන ප්‍රතිචාර හතර අතුරෙන්, එකක් හෝ වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය / ප්‍රතිචාර කවරේද?

| (1) | (2) | (3) | (4) | (5) |
|---|---|---|---|---|
| (a) සහ (b) පමණක් නිවැරදිය. | (b) සහ (c) පමණක් නිවැරදිය. | (c) සහ (d) පමණක් නිවැරදිය. | (d) සහ (a) පමණක් නිවැරදිය | වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදිය. |

11. ∝, β හා γ පිළිබඳව පහත ප්‍රකාශ වලින් සත්‍ය වන්නේ,

(a) ∝ කිරණ ධන ආරෝපිත වේ.
(b) β කිරණ සෘණ ආරෝපිත වේ.
(c) ∝ හා β කිරණවල වේගය γ ට වඩා අඩුයි.
(d) γ කිරණ විද්‍යුත් ක්ෂේත්‍රයක දී අපගමනය වේ.

12. ක්වොන්ටම් අංක පිළිබඳව සිදුකර ඇති පහත ප්‍රකාශ වලින් කවරක් / කවර ඒවා නිවැරදි ද?

(a) $n = 3$, $m_\ell = 2$ වන ඉලෙක්ට්‍රෝනය ඇත්තේ තුන්වන ප්‍රධාන ශක්ති මට්ටමේ ය.
(b) $n = 2$, $m_\ell = 1$ වන ඉලෙක්ට්‍රෝනය අඩංගු වන්නේ P උපශක්ති මට්ටමේ ය.
(c) $n = 4$ වන අවස්ථාවක ඉලෙක්ට්‍රෝනයක් සඳහා 4, 3, -4, -½ ක්වොන්ටම් අංක කුලකය තිබිය හැක.
(d) $n = 3$ වන අවස්ථාවක තිබිය හැකි උපරිම ඉලෙක්ට්‍රෝන ගණන 16 කි.

13. විද්‍යාත්මක සොයා ගැනීම් සම්බන්ධව නිවැරදි සංකලනය වනුයේ,

(a) න්‍යෂ්ටික ආකෘතිය - අර්නස්ට් රදර්ෆඩ්
(b) ධන කිරණ - තොම්සන්
(c) VSEPR වාදය - හුන්ඩ්ස්
(d) විකිරණශීලිතාව - හෙන්රි බෙකරල්

14. KI ජලීය ද්‍රාවණයක පවතින ආකර්ෂණ බල වන්නේ,

(a) ලන්ඩන් බල (b) H බන්ධන
(c) අයන - ද්විධ්‍රැව ආකර්ෂණ බල (d) ද්විධ්‍රැව - ප්‍රේරිත ද්විධ්‍රැව ආකර්ෂණ බල

15. හයිඩ්‍රජන්වල විමෝචන වර්ණාවලිය සම්බන්ධව සත්‍ය වන්නේ,

(a) එහි බාමර් ශ්‍රේණියේ කැපී පෙනෙන රේඛා 4 කි.
(b) ලයිමාන් ශ්‍රේණියේ ඉහළම ශක්ති රේඛාවේ අගය H වල පළමු අයනීකරණ ශක්තිය ලෙස ගත හැක.
(c) රේඛා අතර ශක්ති පරතරය අඩුවන විට ශක්ති අගය ද අඩු වේ.
(d) එහි ලයිමාන් ශ්‍රේණිය පාරජම්බුල කලාපයේ පිහිටා ඇත.



Scanned with CamScanner

- අංක 16 සිට 20 තෙක් ප්‍රශ්න සඳහා පහත උපදෙස් අනුගමනය කරන්න.

| ප්‍රතිචාරය | පළමුවෙනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| (1) | සත්‍ය වේ. | සත්‍ය වන අතර, පළමුවැනි ප්‍රකාශය නිවැරදිව පහදා දෙයි. |
| (2) | සත්‍ය වේ. | සත්‍ය වන නමුත්, පළමුවැනි ප්‍රකාශය නිවැරදිව පහදා නොදෙයි. |
| (3) | සත්‍ය වේ. | අසත්‍ය වේ. |
| (4) | අසත්‍ය වේ. | සත්‍ය වේ. |
| (5) | අසත්‍ය වේ. | අසත්‍ය වේ. |

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 16. | ජලීය NaCl ද්‍රාවණයක් විද්‍යුතය සන්නයනය කරයි. | ජලීය NaCl ද්‍රාවණයේ සචල $Na^+$ හා $Cl^-$ අයන ඇත. |
| 17. | LiF වලට වඩා LiI වල ඉහළ සහසංයුජ ලක්ෂණ ඇත. | ඇනායනය විශාල හා ඉහළ ආරෝපණයක් ඇති විට අධික ධ්‍රැවීකරණ බලයක් ඇත. |
| 18. | $Br_2$ හා ICl හි සාපේක්ෂ අණුක ස්කන්ධ ආසන්න ලෙස සමාන වුවද ICl හි තාපාංකය $Br_2$ ට වඩා ඉහළ වේ. | $Br_2$ නිර්ධ්‍රැවීය වන අතර ICl ධ්‍රැවීය වේ. |
| 19. | රන්පත් පරීක්ෂාවේ දී සමහර α අංශුවල ගමන් මඟ වෙනස් විය. | රන්පත් පරීක්ෂණයේ දී විශාල කිරණ ප්‍රමාණයක් අපගමනය නොවී ගමන් කළේය. |
| 20. | $H_2O$ හි $H\hat{O}H$ බන්ධන කෝණයට වඩා $H_2S$ හි $H\hat{S}H$ හි බන්ධන කෝණය විශාල ය. | O හි විද්‍යුත් සෘණතාවයට වඩා S හි විද්‍යුත් සෘණතාව අඩු ය. |

## - ව්‍යුහගත රචනා -

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(1).(a). පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

(i) C, N සහ O අතරින් ඉහළම දෙවන අයනීකරණ ශක්තිය පවතින්නේ කුමකට ද? (.................)

(ii) $NH_3$, $NO_2^-$ සහ $NO_3^-$ අතරින් ඉහළම විද්‍යුත් සෘණතාව සහිත N පරමාණුව පවතින්නේ කුමකට ද? (.................)

(iii) $Na^+$ , $K^+$ සහ $Mg^{2+}$ යන අයන අතරින් අඩුම ධ්‍රැවීකාරක බලය පවතින්නේ කුමකට ද? (.................)

(iv) Li, N සහ S යන මූලද්‍රව්‍ය අතරින් ඉලෙක්ට්‍රෝන ලබා ගැනීමේ ශක්තිය සඳහා වැඩිම සෘණ අගය පවතින්නේ කුමකට ද? (.................)

(v) NO, $Br_2$ සහ $CH_4$ අතරින් ඉහළම තාපාංකය පවතින්නේ කුමකට ද? (.................)


(vi) $NO_2^+$ , $NO_2^-$ සහ $NO_2$ අතරින් කුඩාම බන්ධන කෝණය ඇත්තේ කුමකට ද? (.................)

(04 x 6)




Scanned with CamScanner

(b).(i) $CH_3NCS$ අණුව සඳහා වඩාත්ම පිළිගත හැකි ලුවිස් තිත් - ඉරි ව්‍යුහය අඳින්න. එහි පරමාණුක සැකිල්ල පහත දක්වා ඇත.



(06)

(ii) $CH_2N_2O$ අණුව සඳහා වඩාත්ම ස්ථායි ලුවිස් තිත් - ඉරි ව්‍යුහය පහත දක්වා ඇත. මෙම අණුව සඳහා තවත් ලුවිස් තිත් - ඉරි ව්‍යුහ (සම්ප්‍රයුක්ත ව්‍යුහ) තුනක් අඳින්න.



(04 x 3)


(iii) පහත සඳහන් ලුවිස් තිත්-ඉරි ව්‍යුහය පදනම් කරගෙන වගුවේ දක්වා ඇති C, N,O සහ P පරමාණුවල

(I) පරමාණුව වටා VSEPR යුගල්


(II) පරමාණුව වටා ඉලෙක්ට්‍රෝන යුගල් ජ්‍යාමිතිය

(III) පරමාණුව වටා හැඩය

(IV) පරමාණුවේ මුහුම්කරණය සඳහන් කරන්න.



පහත දැක්වෙන පරිදි පරමාණු අංකනය කර ඇත.



(01 x 16)

| | | $C^1$ | $N^3$ | $O^5$ | $P^6$ |
|---|---|---|---|---|---|
| I | VSEPR යුගල් | | | | |
| II | ඉලෙක්ට්‍රෝන යුගල ජ්‍යාමිතිය | | | | |
| III | හැඩය | | | | |
| IV | මුහුම්කරණය | | | | |

කොටස් (iv) සිට (vii), ඉහත (iii) කොටසෙහි දෙන ලද ලුවිස් තිත් - ඉරි ව්‍යුහය මත පදනම් වේ.

(iv) පහත දැක්වෙන පරමාණු දෙක අතර σ බන්ධන සෑදීමට සහභාගී වන පරමාණුක / මුහුම් කාක්ෂික හඳුනාගන්න.

(I) $H-C^1$ H ........................ $C^1$ ........................

(II) $C^1-N^3$ $C^1$ ........................ $N^3$ ........................

(III) $N^3-N^4$ $N^3$ ........................ $N^4$ ........................

(IV) $N^4-O^5$ $N^4$ ........................ $O^5$ ........................

(V) $O^5-P^6$ $O^5$ ........................ $P^6$ ........................

(VI) $P^6-H$ $P^6$ ........................ H ........................

(01 x 12)



Scanned with CamScanner

(v) පහත දැක්වෙන පරමාණු දෙක අතර π බන්ධන සෑදීමට සහභාගී වන පරමාණුක කාක්ෂික හඳුනා ගන්න.

(I) $C^1 - O^2$ $C^1$ ........................ $O^2$ ........................

(II) $N^3 - N^4$ $N^3$ ........................ $N^4$ ........................

(01 x 4)

(vi) $C^1$, $N^3$, $O^5$ සහ $P^6$ පරමාණු වටා ආසන්න බන්ධන කෝණ සඳහන්කරන්න.

$C^1$ .................. $N^3$ .................. $O^5$ .................. $P^6$ .................. (01 x 4)

(vii) $C^1$, $N^3$, $N^4$, $O^5$ සහ $P^6$ පරමාණු ඒවායේ විද්‍යුත් සෘණතාව වැඩිවන පිළිවෙළට සකසන්න.

.................. < .................. < .................. < .................. < .................. (04)

(c). වරහන් තුළ දක්වා ඇති ගුණය වැඩිවන පිළිවෙළට සකසන්න. හේතු අවශ්‍ය නැත.

(i) Na, K, Mg, Cl, S, O (විද්‍යුත් සෘණතාව)

.............. < .............. < .............. < .............. < .............. < ..............

(ii) $Na^+$, $Mg^{2+}$, $N^{3-}$, $O^{2-}$, $Al^{3+}$, $S^{2-}$ (අයනික අරය)

.............. < .............. < .............. < .............. < .............. < ..............


(iii) 2S, 3S, 3d, 2P, 4S, 3P (කාක්ෂිකයේ අඩංගු ඉලෙක්ට්‍රෝනයක ශක්තිය)

.............. < .............. < .............. < .............. < .............. < ..............

(06 x 3)

(2).(a). පහත දක්වා ඇත්තේ H පරමාණුවක ඉලෙක්ට්‍රෝන විමෝචනයට අදාළ ශක්ති මට්ටම් සටහන සහ විමෝචන වර්ණාවලියෙහි බාමර් ශ්‍රේණියට අදාළ මුල් රේඛා හතර වේ.
($h = 6.626 \times 10^{-34}$ JS, $C = 3 \times 10^8$ $ms^{-1}$, $N_A = 6.022 \times 10^{23}$ $mol^{-1}$)


H පරමාණුක ශක්ති මට්ටම්.






Scanned with CamScanner

H පරමාණුක විමෝචන වර්ණාවලිය




ශ්‍රේණිය ....................................  බාමර් ශ්‍රේණිය ....................................

විද්‍යුත් චුම්බක වර්ණාවලියෙහි ප්‍රදේශය .................................... .................................... ....................................

(i) ඉහත P, Q, R සහ S රේඛා හරහා දී ඇති ශක්ති මට්ටම් සටහනෙහි ලකුණු කර දක්වන්න. (ඊතල මගින්) ඒවා නිවැරදිව නම් කරන්න. (02 x 4)

(ii) S රේඛාව ඇති වීමේ දී විමෝචනය වන ශක්තිය ගණනය කරන්න. ($KJmol^{-1}$ වලින්) (08)

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

(iii) එම ශක්තියට අනුරූප විකිරණයෙහි තරංග ආයාමය නැනෝ මීටර් (nm) වලින් ගණනය කරන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

(17)

(iv) ලයිමාන් සහ පාෂන් ශ්‍රේණි වලට අදාළ විමෝචන ඉහත ශක්ති මට්ටම් සටහනෙහි ඇඳ දක්වන්න. (ඊතල මගින්) (5 + 5)

(v) ඉහත (iv) හි අඳින ලද ඉලෙක්ට්‍රෝන සංක්‍රමණවලට අදාළ වර්ණාවලී රේඛා වර්ණාවලි සටහනෙහි ලකුණු කර පෙන්වන්න. ශ්‍රේණිය නම් කරන්න. (5 + 5) (2 + 2)

(vi) වර්ණාවලි සටහන තුළ එම රේඛා ශ්‍රේණි තුන විද්‍යුත් චුම්බක වර්ණාවලියෙහි අයත් ප්‍රදේශ දී ඇති තිස්තැන්හි ලියා දක්වන්න. (2 x 3)

(vii) H පරමාණුවෙහි පළමු අයනීකරණ ශක්තිය ගණනය කරන්න. ($KJmol^{-1}$ වලින්).

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

(07)



Scanned with CamScanner

(b). (i) පරමාණුක කාක්ෂිකයක් විස්තර කරනුයේ n, $\ell$ සහ $m_\ell$ ක්වොන්ටම් අංක 03 මගිනි. අදාළ ක්වොන්ටම් අංක සහ පරමාණුක කාක්ෂිකයේ නම පහත දැක්වෙන කොටු තුළ ලියන්න.

| | n | $\ell$ | $m_\ell$ | පරමාණුක කාක්ෂිකය |
|---|---|---|---|---|
| (i) | ☐ | ☐ | +1 | 5P |
| (ii) | 4 | ☐ | –2 | ☐ |
| (iii) | ☐ | ☐ | ☐ | 3S |

(01 x 7)

(ii) පහත රසායනික විශේෂ ඇසුරින් පිළිතුරු සපයන්න.

$H_2O$, $XeF_4$, $I_3^-$ , $BF_3$ , $SO_3$ , $SF_4$

| | | |
|---|---|---|
| I. | $180^0$ ක බන්ධන කෝණයක් සහිත අණුවක් / අයනයක් වන්නේ, | |
| II. | $NO_3^-$ අයනය සමඟ සම ඉලෙක්ට්‍රෝනික වන්නේ | |
| III. | එකම තලයෙහි පරමාණු පහක් අඩංගු වන්නේ | |
| IV. | බන්ධන ඉලෙක්ට්‍රෝන යුගල් සංඛ්‍යාව සහ එකසර ඉලෙක්ට්‍රෝන යුගල් සංඛ්‍යාව සමාන වන්නේ | |
| V. | ද්විධ්‍රැව ඝූර්ණයක් සහිත අණුවක් වන්නේ | |

(03 x 5)

(c).(i) පහත අයනවල ඉලෙක්ට්‍රෝන වින්‍යාස ලියන්න.

(i) $Cr^{3+}$ - ..................................................................

(ii) $Br^-$ - ..................................................................

(iii) $Cu^{2+}$ - ..................................................................

(iv) $Co^{3+}$ - .................................................................. (02 x 4)

## - රචනා -

(3).(a). ආවර්තිතා වගුවට අයත් ආන්තරික නොවන P, Q, R, S සහ T නම් අනුයාත මූලද්‍රව්‍ය පහක පරමාණුක ක්‍රමාංක පිළිවෙළින් Z, (Z + 1), (Z + 2), (Z + 3) සහ (Z + 4) වේ. Q නම් මූලද්‍රව්‍යයෙහි මුල් අනුයාත අයනීකරණ ශක්ති හය පිළිවෙළින් $KJmol^{-1}$ වලින් 800, 1590, 3240, 4360, 16100 සහ 19800 වේ.

(i) හේතු දක්වමින් ආවර්තිතා වගුවෙහි Q අයත් කාණ්ඩය හඳුනා ගන්න. (10)

(ii) R හි ප්‍රථම අයනීකරණ ශක්තිය S හි ප්‍රථම අයනීකරණ ශක්තියට වඩා වැඩි බව සොයාගෙන ඇත. එම විචලනයට හේතු දක්වන්න. (10)

(iii) R හි මුල් අනුයාත අයනීකරණ ශක්ති හයෙහි විචලනය ප්‍රස්ථාර ගත කරන්න. (10)

(iv) ඉහත මූලද්‍රව්‍ය පහෙහි දෙවන අයනීකරණ ශක්ති විචලනය දළ ප්‍රස්ථාරයක දක්වන්න. (10)

(v) එම මූලද්‍රව්‍ය අතරින් කැල්කොජන කාණ්ඩයේ මූලද්‍රව්‍ය කුමක් ද? (06)



Scanned with CamScanner

(b) (i) (I) චාලක ශක්තිය $18.2 \times 10^{-25}$ J හා ස්කන්ධය $9.1 \times 10^{-31}$ kg වන ඉලෙක්ට්‍රෝනයක ප්‍රවේගය ගණනය කරන්න. (චාලක ශක්තිය $\in = \frac{1}{2} mv^2$) (10)

(II) එම ඉලෙක්ට්‍රෝනයේ තරංග ආයාමය nm වලින් ගණනය කරන්න. (15)

(III) එම ඉලෙක්ට්‍රෝනයේ චාලක ශක්තිය ඉහත (i) හි අගය මෙන් නව ගුණයක් (9) වන විට ඉලෙක්ට්‍රෝනයේ තරංග ආයාමය *nm* වලින් ගණනය කරන්න. (10)

(ii) පහත ප්‍රකාශ කෙටියෙන් පහදන්න.

(I) $CaCO_3$ හි තාපස්ථායීතාව, $BeCO_3$ ට වඩා ඉහළ වේ.

(II) $H_2O$ වල බන්ධන කෝණය $H_2S$ ට වඩා ඉහළ වේ.

(10 x 2)

(c). (i) පහත ප්‍රභේද වල ප්‍රාථමික හා ද්විතියික අන්තර්ක්‍රියා ඇසුරින් වගුව සම්පූර්ණ කරන්න.


| අන්තර් ක්‍රියා වර්ගය / ද්‍රව්‍ය | | ප්‍රාථමික අන්තර් ක්‍රියා | ද්විතියික අන්තර් ක්‍රියා |
|---|---|---|---|
| I | ඝන අයඩීන් ($I_{2(S)}$) | | |
| II | ඝන සෝඩියම් අයඩයිඩ $NaI_{(S)}$ | | |
| III | අයිස් $H_2O_{(S)}$ | | |
| IV | හයිඩ්‍රජන් ෆ්ලෝරයිඩ $HF_{(l)}$ | | |
| V | $CO_{2(g)}$ | | |
| VI | $O_{2(g)}$ | | |
| | | (02 x 6) | (02 x 6) |

(ii) පහත ප්‍රභේදවල මධ්‍ය පරමාණුව වටා හැඩය අපෝහනය කරන්න.

(i) $ICl_4^-$ (ii) $SF_3N$ (iii) $XeF_2$

(iv) $SCl_4$ (v) $XeOF_4$

(05 x 5)




8 of 8

Scanned with CamScanner